# බෞද්ධ සාහිත්‍යයේ ගවයාගේ ආස්ථානය

ආචාර්ය දොඩම්කුඹුරේ ධම්මදස්සි හිමි

බෞද්ධ සාහිත්‍යයෙහි සුවිශේෂී තත්වයක් උසුලන සත්වයින් සිව් දෙනෙකි. සිංහයා, අශ්වයා, ඇතා හා ගවයා ය.* මේ සත්වයින් උපමා කොටගෙන මෙන් ම ප්‍රමාණ කොටගෙන ද පාලි ත්‍රිපිටකයෙහි සූත්‍ර බොහෝ ගණනක් දේශිත ය. අපගේ අවධානය මෙහි දී යොමු වන්නේ අවසනට සඳහන් කළ සත්වයා වන ගවයා පිළිබඳ ව ය. පාලි ත්‍රිපිටකයෙහි මෙන් ම විශේෂයෙන් ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදායෙහි ගවයා වෙත ප්‍රදානය වී ඇති උත්කෘෂ්ට ස්ථානය හඳුනා ගැනීම මෙහි මුඛ්‍ය පරමාර්ථයයි.

බුදුදහම සියලු සතුන් වෙත මෙත් සිත පැතිරවීමේ ආනිසංස දක්වමින් නිබඳ ව එහි නියුක්ත වීමට මනුෂ්‍යයා ප්‍රචෝදනය කරයි.* මේ අතර ගවයා පිළිබඳ ව අධිකතර අවධානයක් යොමු කරන මුල් බුදුසමය, එම සත්වයා වෙත විශේෂයෙන් ම කරුණාක්ෂිය හෙළයි. ඇතැම් සූත්‍රවල අන්තර්ගතය පරීක්ෂ කරන විට ගවයා මිනිසා සමග සම කක්ෂයෙහි ලා සලකා ඇති බව පෙනෙයි. මීට සාපේක්ෂකව සංස්කෘත සාහිත්‍ය වෙතට යොමු වීමේ දී පැහැදිලි වන්නේ ''ගවයා'' හින්දූන්ගේ ද අපමණ ගෞරවාදරයට පාත්‍ර වී ඇති බව යි.

ගවයා සමෘද්ධියේ සංකේතය ලෙසින් හින්දූහු විශ්වාස කරති. (In Hinduism, Cow is revered as the source of food and symbol of life) වේද ග්‍රන්ථවල සඳහන් වන්නේ ගවයා දෙවියන්ගෙන්